00106

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 03 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023/2024
සාධාරණත්වය හා භාර නීතිය - LLU3505
කාලය පැය තුන (03) යි.

දිනය : 2025 මැයි 21 | වේලාව : ප.ව. 01.30 - ප.ව. 04.30

මුළු ප්‍රශ්න ගණන - 08.

**01 කොටසින් ප්‍රශ්න එකක් (1) හා 02 කොටසින් ප්‍රශ්න හතරක් (4) ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

## 01 කොටස - සාධාරණත්වය

**මෙම කොටසින් ප්‍රශ්න එකකට (1) පමණක් පිළිතුරු සපයන්න.**

01. "ඇතැම් නීතිමය ආරවුල්වලදී වඩාත් නම්‍යශීලී සහ හෘද සාක්ෂියට එකඟව විසඳුම් ලබා දෙමින් පොදු නීතියේ දෘඪතාවයට සහ සීමාකාරීත්වයට ප්‍රතිචාරයක් ලෙස සාධාරණත්වය වර්ධනය විය. හානිපූර්ණය වැනි නීතිමය පිළියම් ප්‍රමාණවත් නොවන බව ඔප්පු වන අවස්ථාවලදී, සාධාරණත්වය සහතික කිරීම අරමුණු කරගත් ප්‍රතිකර්ම සැපයීමේ රාමුව, සාධාරණත්වයේ වඩාත් ම වැදගත් ලක්ෂණයක් වේ."

මෙම ප්‍රකාශයේ නිරවද්‍යතාවය විවේචනාත්මකව තක්සේරු කරන්න. (ලකුණු 20)



59

02. "පොදු නීතියේ දැඩි බව ඌනපූර්ණය කරන, යුක්තිය පසිඳලීමේ පද්ධතියක් ලෙස සාධාරණත්වය සියවස් ගණනාවක් පුරා වර්ධනය වී ඇත. සාධාරණ බව විදහා දක්වන, හෘදය සාක්ෂිය සහ සදාචාරාත්මක අවංකත්වය පිළිබිඹු කරන සාධාරණත්ව ආප්තයන් හා මූලධර්ම මෙම ක්‍රමයේ කේන්ද්‍රය වන අතර එය පුළුල් නෛතික පරාසයක විසිරී පවතින අධිකරණ අභිමතය අඛණ්ඩව හැඩගස්වයි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද?

**සාධාරණත්වයේ ආප්තයන් අවම වශයෙන් හතරක්වත්** යොදාගනිමින් නූතන නීතිය තුළ එහි අඛණ්ඩ අදාළත්වය සහ ප්‍රායෝගික යෙදීම විවේචනාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු 20)

## <u>02 කොටස - භාර නීතිය</u>

### <u>මෙම කොටසින් ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සපයන්න.</u>

03. ශ්‍රී ලංකා නීතිය යටතේ ප්‍රකාශිත භාරයක වලංගුභාවය පිළිබඳව ප්‍රශ්න මතු කරන පවරාදීම් කිහිපයක් උපාලි මහතා විසින් ඔහුගේ අවසන් කැමති පත්‍රයේ සිදු කරන ලදී. පළමුව, ඔහු රට තුළට අවිධිමත් ලෙස ගෙන ආ බව කියන නිශ්චිත රන් වත්කම් ඔහුගේ මිතුරා වන සුදේශ් වෙත ලබා දෙන ලෙසත්, ඒවා පෞද්ගලිකව විකුණා එම මුදල් ඔහුගේ පුත් පහන්ගේ අර්ථලාභය සඳහා භාවිත කරන ලෙසත් ඔහු නියෝග කළේ ය. දෙවනුව, කොටස් වෙළඳපොලේ ලාභ ලබන ඕනෑම ව්‍යාපාර දෙකකින් උපයන ආදායම ඔහුගේ වැඩිමහල් පුත්‍රයා වන වයස අවුරුදු 16 ක් වන කසුන් වෙත ලබා දෙන ලෙසත්, එය කසුන්ගේ සීයා සහ ආච්චීගේ අර්ථලාභය වෙනුවෙන් භාවිත කරන ලෙසත් ඔහු නියෝග කළේ ය. අවසාන වශයෙන්, විධිමත් නොතාරිස් ඔප්පුවක් ක්‍රියාත්මක නොකර, උපාලි මහතා අනාගත සාමාජිකයින් ඇතුළුව තම ගමේ

සුභසාධන සංගමයේ අර්ථලාභය වෙනුවෙන් ඔහුගේ බිරිඳ සඳරේකා භාරකරු ලෙස පත් කරමින් ඔහුගේ පොල් වත්ත මත භාරයක් ඇති කිරීමට උත්සාහ කළේ ය.

ඉහත තත්වයන් අනුව ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වලංගු භාර නිර්මාණය කර තිබේද යන්න සාකච්ඡා කරන්න. භාර ආඥා පනතේ අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතිය ඔබේ පිළිතුරට සහාය කරගන්න.

(ලකුණු 20)

04. "පෞද්ගලික භාර සඳහා අදාළ වන සදාකාලිකත්වයට එරෙහි රීතිය වැනි ඇතැම් රීතිවලින් නිදහස් ව ක්‍රියාත්මක වීම හා පොදු යහපත සැපයීමේ අවශ්‍යතාවය හේතුවෙන් පුණ්‍ය භාර, භාර නීතියේ සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන තිබේ. ශ්‍රී ලංකාවේ, පුණ්‍ය භාර සඳහා වන නීතිමය රාමුව මුල් බැසගෙන ඇත්තේ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතියේ එකතුවක් තුළ වන අතර එය බොහෝ විට ඉංග්‍රීසි නීති මූලධර්ම මගින් බලපෑමට ලක් වී ඇතත් සමාජීය හා සංස්කෘතික සන්දර්භයන් මගින් දේශීය අනුවර්තනයන් ද ලබා ඇත්තේ ය."

ඉංග්‍රීසි නීතිය සහ ශ්‍රී ලංකා නීතිය යටතේ පුණ්‍ය භාර සංකල්පය සහ එහි නීතිමය නියාමනය විවේචනාත්මකව සංසන්දනය කරන්න. ඔබේ පිළිතුරේ දී, පුණ්‍ය භාරයක අර්ථ දැක්වීම, වලංගුභාවය සඳහා වන අවශ්‍යතා, පොදු යහපත සැපයීමේ මූලධර්මයේ භූමිකාව සහ එක් එක් අධිකරණ බල ප්‍රදේශයන්හි පුණ්‍ය භාර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමේ දී ඇති ඕනෑම ප්‍රධාන වෙනස්කම් හෝ අභියෝග සාකච්ඡා කරන්න. අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතිය මගින් ඔබේ විශ්ලේෂණය තහවුරු කරන්න.

(ලකුණු 20)

05. අ) සිතුම් සහ පැතුම් ඉතා සමීප මිතුරෝ වෙති. එක් අවස්ථාවක දී, පැතුම්ගේ කැමැත්ත ඇතිව, තෑග්ගෙන් රු. 10,000 ක් අවලංගු කිරීමේ බලය තමා වෙත තබාගනිමින් රු. 100,000 ක තෑග්ගක් සිතුම් විසින් පැතුම්ට ලබා දෙයි. පසුව, සිතුම් මෙම බලය ක්‍රියාත්මක කර තෑග්ගෙන් රු. 10,000 ක කොටස අවලංගු කරයි. සිතුම් විසින් රු. 10,000 ක් අවලංගු කිරීමෙන් පසුව, තම උපන්දින සැමරුම සඳහා සූදානම් වීම වෙනුවෙන් පැතුම් රු. 100,000 ක මුළු මුදලම දැනටමත් වියදම් කර තිබුණි.

සිතුම්ට උපදෙස් දෙන්න.

ආ) ධනවත් ව්‍යාපාරිකයෙකු වන පවන්, ප්‍රසිද්ධ ටේලර්වරයෙකු වන සමන්ගේ හවුල්කාරිත්වය සමඟ රෙදිපිළි ආනයනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. හවුල්කාරිත්ව ගිවිසුමට අනුව, ආනයනික රෙදිපිළි දේශීය වෙළඳපොළට ප්‍රවර්ධනය කිරීම සහ බෙදා හැරීම සමන්ගේ රාජකාරිය විය. මාස කිහිපයකට පසුව, පවන් දැනගත්තේ, සමන් විසින් ඔහුගේ අනුදැනුමකින් තොරව 'SL Clothes' නම් දේශීය පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ ඇති බවත් එමඟින් එම සමාගමට අඩු මිලට රෙදිපිළි ලබා දෙමින් ඉහත ගනුදෙනුවෙන් ඔහු විශාල කොමිස් මුදලක් උපයා ඇති බවත් ය.

පවන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 10 x 2 = ලකුණු 20)

06. "භාරය පරිපාලනය කිරීමේදී ඉහළ ප්‍රමිතියකින් යුත් සැලකිල්ලක් දක්වමින් භාරකරුවෙකු තම වගකීම්වලට දැඩි ලෙස අනුගත වීම අපේක්ෂා කරයි. භාරකරු සද්භාවයෙන් ක්‍රියා කළ විටෙක හෝ ඔවුන්ගේ ක්‍රියාවන් අර්ථලාභීන්ගේ උපරිම යහපතට හේතු වූ බවට විශ්වාස කළ විටෙක පවා භාරය කඩ කිරීමක් ඇති විය හැකිය."

ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතිය සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

07. නවීන් විසින් පරිපාලනය කරනු ලබන භාරයක, සුපිපි (වයස අවුරුදු 20), ජනනි (වයස අවුරුදු 18) සහ තුෂිනි (වයස අවුරුදු 12) නම් කරන ලද අර්ථලාභීන් වේ. අර්ථලාභීන් තිදෙනාගේ සාමූහික ප්‍රතිලාභය සඳහා අක්කර 25 ක රබර් වතුයායක් සහ රුපියල් මිලියන 50 ක් වටිනා රන් එකතුවක් ඇතුළත් වන භාර දේපළ නවීන් විසින් දරාගෙන සිටී. ඊට අමතරව, විශේෂයෙන් තුෂිනිගේ අර්ථලාභය සඳහා 'සුපර් කන්ස්ට්‍රක්ෂන් (පෞද්ගලික) සමාගමේ' 40% ක කොටස් ප්‍රමාණයක් නවීන් විසින් දරනු ලබයි. එක් අවස්ථාවක දී, රන් එකතුව මුදල් බවට පත් කර ඇයට හිමි කොටස ලබාදෙන ලෙස ජනනි විසින් නවීන්ගෙන් ඉල්ලා සිටී. ජනනි සහ තුෂිනි නොදැන, රබර් වතුයායෙන් උපයන ලාභයෙන් රුපියල් 50,000 ක් තම දියණියගේ උපන්දින සැමරුම වෙනුවෙන් අවශ්‍ය මුදල ලබාදෙන මෙන් සුපිපි විසින් පෞද්ගලිකව නවීන්ට බලපෑම් කරයි.

පසුව, නවීන් රන් එකතුවෙන් සැලකිය යුතු කොටසක් විකුණා එමඟින් ලැබෙන ආදායම සහ ඔහුගේ අරමුදල් යොදවා නාවල මහල් නිවාසයක් මිලදී ගනී. තවද, භාරයේ පැවැත්ම හෙළි නොකර හෝ නිසි කැමැත්ත ලබා නොගෙන, ඔහු ඒකපාර්ශ්විකව 'සුපර් කන්ස්ට්‍රක්ෂන් (පෞද්ගලික) සමාගම' සතු සම්පූර්ණ කොටස් සිතිර නම් පුද්ගලයෙකුට විකුණයි. භාර ගිණුම් සහ අදාළ ලියකියවිලි වෙත ප්‍රවේශය ඉල්ලා ජනනි විසින් නවීන් වෙත නැවත නැවතත් ඉල්ලීම් කර ඇත. කෙසේ වෙතත්, නවීන් විවිධ නිදහසට කරුණු ඉදිරිපත් කරමින් අඛණ්ඩව ඊට අනුකූල වීමට අපොහොසත් වී ඇති අතර ඉල්ලා සිටින තොරතුරු සැපයීමට තම වගකීම හිතාමතාම මඟ හැර ඇත.

ඉහත සිදුවීම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ භාර ආඥා පනත යටතේ අර්ථලාභීන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු තීන්දු නීතිය මගින් තහවුරු කළ යුතු ය.

(ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතරින් **ඕනෑම දෙකක් (02)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

අ) *in pari delicto* මූලධර්මය

ආ) සයිප්‍රස් මූලධර්මය / සීප්‍රේ මූලධර්මය (Cy-pres doctrine)

ඇ) ශ්‍රී ලංකාවේ භාර ආඥා පනතේ 02 වන වගන්තිය

ඈ) වැඩිදියුණුව පිළිබඳ පූර්ව නිගමනය (ලකුණු 10 x 02 = 20)

-හිමිකම් ඇවිරිණි-